ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2016.10.18 |

**මහ බැංකුව විසින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ මූල්‍ය පද්ධති ස්ථායිතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා බුන්වත් මූල්‍ය ආයතන හතරක් නිරාකරණය කෙරේ.**

2016.10.10 දින මහජනතාව වෙත නිවේදනය කළ පරිදි, මුදල් මණ්ඩලය විසින් මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති මහජන විශ්වාසය ආරක්ෂා කිරීම පිණිස අදාල නීතිමය ප්‍රතිපාදන වලට අනුකූලව බැංකු නොවන මූල්‍ය ආයතන ගණනාවක් නිරාකරණය කිරීම සම්බන්ධ ගැටළු 2016.10.14 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී සලකා බලන ලදී. ඒ අනුව, මුදල් සමාගම් තුනක තැන්පත්කරුවන්ගේ තැන්පතු සහ එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ නීත්‍යානුකූල ආයෝජකයන්ගේ මුදල් ආපසු ගෙවීම සඳහා නිරාකරණ ක්‍රමවේදයක් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

එම මුදල් සමාගම් තුන වනුයේ, ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ් සහ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම්ය. මෙම සමාගම් තුනම මුදල් වංචා කිරීම හා නිසි පරිදි කළමණාකරනය නොකිරීම හේතුවෙන් 2008 හා 2009 වර්ෂ තුලදී උග්‍ර අර්බුදකාරී මූල්‍ය තත්ත්වයකට පත්වූ අතර තැන්පතු ආපසු ගෙවීම සඳහා මෙම සමාගම් වලට වත්කම් නොමැතිවිය. එම සමාගම් කළමණාකරනය කල පාර්ෂවයන් විසින් නව ප්‍රාග්ධනය යෙදවීමට අපොහොසත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කලින් කලට ගන්නා ලද ප්‍රයත්නයන් මගින් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලබාගත නොහැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම සමාගම් බුන්වත්භාවයට

පත්වූ අතර එතැන් සිට ව්‍යාපාර කටයුතු වල නිසි ලෙස නිරතවීමට නොහැකි විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳාම් කිරීම සඳහා ප්‍රාථමික අලෙවිකාර බලපත්‍රයක් ලබා සිටි එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගම, ගණුදෙනුකරුවන් විසින් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා ලබාදෙන ලද මුදල් වංචාසහගත ලෙස භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2015 වසර අවසාන කාලයේදී උග්‍ර ද්‍රවශීලතා අර්බුදයකට හා බුන්වත් තත්වයට පත්විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 ජනවාරි 4 වන දින එන්ට්‍රස්ට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කළ අතර ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා එහි මෙහෙයුම් සහ කළමණාකරන කටයුතු ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත පවරන ලදී.

මුදල් මණ්ඩලය විසින් මෙම සමාගම්වල නිරාකරණය පිළිබඳ මේ දක්වා පැවති දුර්වල ප්‍රගතිය සමාලෝචනය කොට, නුදුරු අනාගතයේදී තැන්පත්කරුවන්ට සහ ආයෝජකයන්ට නැවත මුදල් ආපසු ගෙවීමට හැකි වන ලෙස මෙම ආයතන යථා තත්වයට පත් කිරීමට තවදුරටත් ඉඩක් නොමැති බව තීරණය කරන ලදී. මේ පිළිබඳව මෙතෙක් ගතවූ දිගුකාලය සැලකිල්ලට ගෙන, සාධාරණ කාලපරිච්ඡේදයක් තුල හා සාධාරණ පොළී අනුපාතයක් සහිතව 2017 වර්ෂයේ සිට වාර්ෂිකව ඉහත දැක්වූ තැන්පතු සහ ආයෝජන මුදල් නැවත ගෙවීම පිණිස බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සමාගම් නිරාකරණය කිරීමේ සැලසුම්, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මේ මගින් ඉහත මුදල් සමාගම් තුනෙහි 11,878 ක තැන්පත්කරුවන් සතු රුපියල් මිලියන 4,868 ක තැන්පතු ප්‍රමාණයක් ආවරණය වේ. එන්ට්‍රස්ට් සමාගමෙහි ආයෝජකයින් 107 කට අයත් රාජ්‍ය සුරැකුම්පත් මගින් සුරක්ෂිත ආයෝජන ප්‍රමාණය වන රුපියල් මිලියන 3,100 ක් නැවත ගෙවීම ඉදිරි සති වලදී සිදුකෙරේ. එම සමාගමේ, පුද්ගලයන් සහ ආයතන 24 කට අයත් රාජ්‍ය සුරකුම්පත් මගින් සුරක්ෂිත නොවූ ආයෝජන මුදල වන රුපියල් මිලියන 8,508 ක් සඳහා රාජ්‍ය සුරැකුම්පත් ලබාදී, එම ආයෝජන ආපසු ගෙවීම සෙලාන් බැන්ක් පීඑල්සී ආයතනයේ කළමණාකරන සහය මත ආපසු ගෙවීමේ සැලැස්මක් යටතේ සිදු කෙරෙනු ඇත. අවශ්‍ය පරිපාලන ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීමෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි තොරතුරු තැන්පත්කරුවන් සහ ආයෝජකයන් වෙත ඉදිරි කාලයේදී නිවේදනය කරනු ලැබේ. මෙම නිරාකරණ සැලැස්ම නීතිමය වශයෙන් තහවුරු කරගත් පසු මෙම සමාගම් අදාල නීතීන් අනුව ඈවර කිරීම සිදු කරනු ඇත. මෙම සමාගම් සතුව වත්කම් නොමැති බැවින් සහ ඒවා යථා තත්ත්වයට පත්කොට තැන්පත්කරුවන් සහ ආයෝජකයන් වෙත මුදල් ආපසු ගෙවීම සඳහා කිසිදු ආයෝජකයෙකු විසින් කැමැත්තක් නොදක්වන බැවින් ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතිරි වී ඇති එකම විකල්පය මෙම නිරාකරණ සැලසුම බව මුදල් මණ්ඩලයේ අදහසයි.

මෙම නිරාකරණය කිරීමේ සැලැස්මෙහි කොටසක් ලෙස, මුදල් වංචා කිරීමට හා අයුතු ලෙස භාවිතා කිරීමට වගකිව යුතු එම මූල්‍ය සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට හා කළමණාකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්, ඔවුන්ගෙන් එම මුදල් යලි අය කරගැනීමටත්, අවශ්‍ය සියලුම ප්‍රයත්නයන් ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව තුල නව නීති අංශයක් පිහිටුවනු ලැබේ. එන්ට්‍රස්ට් සමාගම සම්බන්ධව, නීති බලගැන්වීමේ අධිකාරීන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහයද ඇතිව දැනටමත් අදාල නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ පරීක්ෂණ නිලධාරීන් විසින් දැනට පවතින සමාගම්වල සිදුවිය හැකි මෙවැනි වංචාසහගත ක්‍රියාවන් අනාවරණය කරගන්නා අවස්ථාවන් වලද එවැනි ක්‍රියාවන් සිදුකර ඇති පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නව නීති අංශය විසින් පියවර ගනු ඇත. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින අඩුපාඩු නිවැරදි කොට මූල්‍ය ආයතනවල සුරක්ෂිතභාවය හා ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා නියාමන හා අධීක්ෂණ ක්‍රමවේදය ශක්තිමත් කිරීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

කෙසේ වෙතත්, නියාමනය හා අධීක්ෂණය යනු මහජනයා විසින් බැංකු හා මූල්‍ය ආයතනවල සිදුකරනු ලබන සෑම තැන්පතුවක් හා ආයෝජනයක් සඳහා ආරක්ෂණ සහතිකයක් නොවන බව දැඩිව අවධාරණය කිරීම වැදගත්ය. මෙම තැන්පත් හිමියන් හා ආයෝජකයන් මෙන්ම මෙම අරමුදල් යොදා ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන මූල්‍ය ආයතනයන්ද මෙම අරමුදල් මනා ලෙස කළමණාකරනය කිරීම සම්බන්ධව ගනු ලබන ව්‍යාපාරික තීරණ පිළිබඳව මූලික වගකීම ගත යුතුය. ඉහත දැක්වූ අර්බුධකාරී සමාගම්වල තැන්පත් වලින් බොහෝ ප්‍රමාණයක් රැස්කොට ගෙන ඇත්තේ අනවසර මූල්‍ය සේවාවන් මගිනි. විශාල තැන්පත්කරුවන් හා ආයෝජකයන් පවා තමන් වෙත ප්‍රමාණවත් මූල්‍ය දැනුම හා කුසලතාවය තිබියදීත්, අවදානම හා ප්‍රතිලාභ සම්බන්ධයෙන් කල යුතු සාමාන්‍ය යථා තත්ව පරීක්ෂණයන් සිදු කිරීමට සැලකිලිමත් වී නොමැත. ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම වනුයේ ස්ථායි මූල්‍ය පද්ධතියක් තුල සුරක්ෂිත හා ස්ථාවරභාවයකින් යුතුව ආර්ථිකයට හා මහජනයාට වැදගත් වන ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා ආයතනවලට පහසුවන පරිදි පවත්නා නීතිමය රාමුව තුල නියාමනය හා අධීක්ෂණය තුලින් බාහිර ආරක්ෂණයක් සැපයීම පමණි.

එබැවින්, දිගුකාලයක් පුරා පැවති මෙම ගැටළුව විසඳා ගැනීම පිණිස ඉදිරිපත් කෙරෙන මෙම නිරාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහයෝගය දක්වන ලෙස එයට සම්බන්ධ සියළු දෙනාගෙන් කාරුණිකව ඉල්ලා සිටී. මෙසේ සහයෝගය නොලැබේ නම්, පවත්නා නීති ප්‍රකාරව අකමැත්තෙන් වුවද මෙම සමාගම්වල ව්‍යාපාර කටයුතු ඇවර කිරීමට අවසර ලබාදීම හැර වෙනත් විකල්පයක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොමැති බවද දන්වනු ලැබේ.